රිච්මන්ඩ් විද්‍යාලය – Richmond College

| 15 | S | II |
|---|---|---|

දෙවන වාර පරීක්ෂණය - 2019

2nd Term Test – 2019

RICHMOND COLLEGE LIBRARY * GALLE *

ක්‍රිස්තු ධර්මය I, II 8 ශ්‍රේණිය :.........

නම / අංකය:........................................... කාලය - පැය 02 යි.

(සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න)

නම :..................................................................... පංතිය :....................... විභාග අංකය ..........................

## 1 කොටස

(1) නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න

1). දෙවියන් වහන්සේ ට සේවය කිරීමේදී
1. දේව හඬට සවන් දිය යුතුය 2. දෙවියන් වහන්සේට ප්‍රිය වන ලෙස එය කල යුතුය
3. ප්‍රමුඛතාවය දිය යුත්තේ ලෞකික දෙයටය 4. ස්ත්‍රී පුරුෂ භේදයක් නැත

2). ප්‍රේරිතයන් ලෙස නම් ලත් ශ්‍රාවක කණ්ඩායමේ නායකයා වූයේ
1. යොහාන්ය 2. පේදුරුය 3. මතෙව්ය 4. යොකොබ්ය

3). කිතුනු දරුවන් ලෙස අප ක්‍රියාකල යුත්තේ
1. නිරතුරුවම යාච්ඤාවේ යෙදීමෙන්ය
2. දේව වචනය කියවීමෙන්ය
3. වැරදි කරනවුන්ට සමාව නොදීමෙන්ය
4. කිතුනු ගුණාංග ජීවිත තුලින් පෙන්වීමෙන්ය

4) ආත්ම විමසීමේ හැකියාව ශුද්ධාත්ම දීමනාවයි. අපට එය ලබාදී ඇත්තේ
1. අනාගත වාක්‍ය කීමටය 2. දේව බලය ප්‍රකාශ කිරීමටය
3. වැරදි ඉගැන්වීම් වලින් මුලා නොවීමටය 4. දේව පණිවිඩ අවබෝධ කරදීමටය

5). අප ජීවිත තුල ඇති ශුද්ධාත්ම ඵලයක් වන ප්‍රීතිය
1. දරා ගැනීමේ ගුණයයි 2. දෙවියන් වහන්සේ තුළින් ලද හැකි වේ.
3. අන් අය සඳහා වැයවීමයි 4. ගැටළු හමුවේ නොසැලී සිටීමයි

6). ඉව්ලින් ක්‍රානිගේ සේවය තුල ආරම්භ කල පාසැල
1. ප්‍රීති නිවාසය 2. සාමයේ නිවාසය
3. සන්ධ්‍යා නිවාසය 4. නංගි ගෙදර

7). අප තුල ඇති ශුද්ධාත්ම ඵලයක් නොවන්නේ
1. ඉවසීම 2. යහපත්කම
3. අවිශ්වාසය 4. ප්‍රේමය

8) යුදෙව් සමාජයේ පව්කරුවන් ලෙස නොපිලිගැනීමට ලක්වූ ජන කොටසකි.
1. පරිසිවරුය 2. විනයධරයන්ය 3. අයකැමියන්ය 4. පූජකවරුය

9) ජේසුස් වහන්සේට අනුව කාම මිථ්‍යාචාරය කළ කෙනෙකු සම්බන්ධයෙන් ක්‍රියා කල යුතු අන්දම
1. වරදට සමාව දීම 2. ගල් ගැසීම
3. පාපය ප්‍රතික්ෂේප කිරීම 4. අප තුල ඇති පාපයන් අවබෝධ කර ගැනීම

10) බයිබලය අනුව මරියා නැමැති කාන්තාව
1. උපස්ථානයට ප්‍රථම තැන දුන්නාය
2. ලෞකික කටයුතු පිළිබදව වඩාත් සිත යොමු කාලාය
3. ජේසුස්වහන්සේගේ වචනය ඇසීමට ප්‍රිය කලාය
4. අනවශ්‍ය දේ අවබෝධ කර නොගත්තාය

11) ආසියානු ක්‍රිස්තියානි සම්මේලනයේ හා ජගත් ක්‍රිස්තියානි සම්මේලනයේ තනතුරු දැරූ අයෙකි.
1. අතිගරු ඇන්ඩෘ කුමාරගේ හිමිපාණෝ
2. වන්දනීය ඩොනල්ඩ් කනගරත්නම් අනුනායකතුමා
3. ගෞරවනීය සෝමසිරි කුමාරදාස පෙරේරා දේවගැතිතුමා
4. ඉව්ලින්කාන්ති තුමියයි

12) දෙවියන් වහන්සේගේ දේව මැවිල්ල තුල අසමසම ස්ථානයක් හිමිකර දුන්නේ
1. සතුන්ටය
2. ගස්වැල්වලටය
3. මිනිසාටය
4. අහස් මඬලටය

13) මැවිල්ල තුල සර්පයා සංකේතවත් කලේ
1. නපුරයි
2. ලෞකික බවයි
3. නිදහසයි
4. අයහපතයි

14) ශ්‍රාවකත්වය සඳහා දේව කැඳවීම ලැබීමෙන් අපට තේරුම් යන්නේ අප
1. දේව හඬට සවන් දිය යුතුය
2. ශුද්ධාත්ම බලය තුල සන්නද්ධ විය යුතුය
3. තරාතිරම පසුබිම බැලිය යුතුයි
4. යාච්ඤාවෙන් සවිමත් විය යුතුයි

15) ජේසුස්වහන්සේ තෝරාගත් ප්‍රේරිතයන් අතරින් අයකැමියෙක් වූයේ
1. පේදුරුය
2. මතෙව්ය
3. පිලිප්ය
4. යාකොබ්ය

16) ජේසුස්වහන්සේ මෙහෙවරට අදාල දිවැස්වැකි අඩංගු ග්‍රන්ථය වූයේ
1. ජෙරමියාය
2. යෙසායා ය.
3. හොෂියාය
4. නෙහෙමියාය

17) ප්‍රේරිතයන්ගේ පාදවල දූලි ගසා දැමීමට නියම කිරීමෙන් සංකේතවත් වූයේ
1. සරල වාම් දිවි පෙවෙත
2. ලෞකික අවශ්‍යතා මත භාරදීම
3. දේව විනිශ්චය
4. පාවහන් හෝ සැරයටියක් රැගෙන නොයාම

18) දේව සේවය සඳහා කැඳවීම ලබන අය තුල තිබිය යුතු ගුණාංගයක් නොවේ
1. කීකරුබව
2. වංක බව
3. නිහතමානි බව
4. ඇදහිල්ල

19) අයහපත් බැටළු එඬේරෙකු තුල ඇති ලක්ෂණයකි
1. තම බැටළුවන් හොඳින් හැඳිනීම
2. දුබල වූවන්ට උපකාර කිරීම
3. රැළටපිටුපසින් ගමන් කිරීම
4. රැළට අවශ්‍ය රැකවරණය සැලකීම

20) සෙසු ශ්‍රාවකයන්ට වඩා පේදුරු තුල ජේසුස්වහන්සේ බලාපොරොත්තු වූ විශේෂ ගුණාංගය නම්
1. උන්වහන්සේට ප්‍රේම කිරීම
2. නොවෙනස්වන පූජාවීමේ ප්‍රේමය
3. බැටළුවන් පෝෂණය කිරීම
4. බැටළුවන්ගේ එඬේරා වීම

(2x 20=40)

## II කොටස

*** පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4කට පිළිතුරු ලියන්න.**

**(1) පහත ප්‍රශ්නවලට ඉතා කෙටි පිළිතුරු ලියන්න.**

1). "බයිබල් අම්මාවරුන් " යන විරුදාලියෙන් පිදුම් ලැබූ කාන්තාවන් දෙදෙනා නම් කරන්න.
2) මුල් ශ්‍රාවකයන් සිය ධර්මදූත මෙහෙවරට කැඳවූයේ කොහේදීද?
3) අප වෙත ලබා දී ඇති ශුද්ධාත්ම දීමනා 2 ක් ලියන්න
4) ඩොනල්ඩ් කනගරත්නම් අනුනායකත තුමා "සංසිදියාවේ නිවස" ලෙස තමා ජීවත්වූ නිවස පවරා දුන්නේ කොහේටද?
5) ජේසුස්වහන්සේ වෙතට හැරුණු සාකවුස් ලබාදුන් ප්‍රතිචාරය කුමක්ද?

6) (i) දෙවියන්වහන්සේ මනුෂ්‍යයා නිර්මාණය කිරීමට භාවිතා කලේ කුමක්ද?
(ii) ශරීරය නැවත එම ස්භාවයට හැරෙන්නේ කුමන අවස්ථාවේද?

7) (i) ඊශ්‍රායෙල් ජනතාවට විමුක්තිය ලබාදීම සදහා දෙවියන් වහන්සේ තෝරා ගත්තේ කාවද?
(ii) පොරොන්දු දේශය කරා යන ගමනේදී දිවා හා රාත්‍රී කාලයේදී ඔවුන්ට මග පෙන්වූයේ මොනවාද?

8) දේව කැදවීම යනු කුමක්ද?

9) තම එකම පුත්‍රයා මරණයට පත්වූ විට කම්පාවට පත්වූ වැන්දඹු ස්ත්‍රිය ජීවත් වූයේ කොහේද?

10) පේදුරුතුමා ජේසුස්වහන්සේ ගැන කල මහා ප්‍රකාශනය කුමක්ද?

(2x10=20)

**(2) "මරියා යහපත් දේ තෝරාගෙන ඇත. එය අද කෙරෙන් පැහැර නොගනී"**

1) මෙසේ පැවසුවේ කවුරුන් විසින් කාහටද? (ල. 2)

2) මෙම කථාව අනුව මාර්තා හා මරියාගෙන් දිස්වූ චරිත ලක්ෂණ 2 බැගින් වෙන වෙනම ලියන්න (ල. 3)

3) ජේසුස්වහ්නසේ කාන්තාවන් දේව සේවයට කැදවීමෙන් කාන්තාවන්ට ගෙනදුන් අභියෝග 5 ක් ලියන්න (ල. 5)

**(3) "අපි කිතුනු වගකීම් ඉටුකර සේවයකට යොමුවෙමු."**

1) පේදුරුතුමා ජේසුස්වහන්සේ වෙතින් ලද වගකීම කුමක්ද? (ල. 2)

2) ධර්මදූත මෙහෙවරේදී ශ්‍රාවකයින් ජේසුස්වහන්සේ වෙතින් බලය ලැබූ කාර්යයන් 3 ක් ලියන්න (ල. 3)

3) ජේසුස්වහන්සේ කිතුනු අපගෙන් බලාපොරොත්තු වන එඩේරික සේවය කුමක්දැයි පැහැදිලි කරන්න (ල. 5)

**(4) කිතුනු දිවිය රස ගන්වන එල හදුනා ගනිමු.**

1) ශුද්ධාත්මයාණන් කරනකොට ගෙන අප ජීවිත තුල වර්ධනය විය හැකි ශුද්ධාත්ම එල 4ක් නම් කරන්න. (ල. 2)

2) අප තුල වර්ධනය විය හැකි ශුද්ධාත්ම එල 3ක් පහත දැක්වේ. එම ශුද්ධාත්ම එල 3 කෙටියෙන් විස්තර කරන්න. (ල. 3)
ප්‍රේමය -
ඉවසීම -
විශ්වාසවන්තකම -

3) ඔබේ අධ්‍යාත්මික ජීවිතය සම්පූර්ණ වීමට මෙම ශුද්ධාත්ම එල ඔබට උපකාරී වේ. මෙම ශුද්ධාත්ම එල නිසා කිතුනු ජීවිතයට එකතුවිය යුතු යහපත් දේවල් 5 ක් ලියන්න. (ල. 5)

**(5) " වෙහෙසෙන බර උසුලන්නාවූ සියල්ලෙහි මා වෙත එන්න මම ඔබට සහනය දෙමි"**

1) මෙලෙස ජේසුස්වහන්සේ තුලින් සහනය ලැබූ දෙදෙනෙක් නම් කරන්න (ල. 2)

2) ඉහත ඔබ නම් කළ එක් අයෙක් ගැන කෙටි සටහනක් ලියන්න. (ල. 3)

3) මෙලෙස සමාජයෙන් කොන්වූ පිලිගැනීමට ලක්නොවූ අය වෙනුවෙන් කිතුනු අපගේ වගකීම කුමක් විය යුතුද? (ල. 5)

**(6) "ශ්‍රී ලාංකික සමාජය තුලද දේව ගෞරවය උදෙසා ජීවිත කැපකල අය වේ"**

1) මෙසේ ක්‍රියා කළ ඉංග්‍රීසි ජාතික කාන්තාව නම් කරන්න (ල. 2)

2) ඇය සමාජ සත්කාරය සදහා ඉදිකල ගොඩනැගිලි 3ක් නම් කරන්න (ල. 3)

3) ඇය "සුදු අම්මා" නමින් හැදින්වීමට හේතුවූ කාරණා කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)